# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,169 — 1960 ජූලි 29 වැනි සිකුරාදා — 29.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 561 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 564 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 566 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 572 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටින් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ලාන්ච් කොක්ස්වේන් වරයින්ගේ තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලාන්ච් කොක්ස්වේන් වරුන්ගේ තනතුරු 2ක් සඳහා අයදුම්පත් කැඳවා තිබේ. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පත් 1960 සැප්තැම්බර් මස 1 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

**2. වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,044—42—1,926ක් වේ.

**3. සේවා කොන්දේසි.**—

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීමේ මුල් අවුරුදු 3 සෝදිසි කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

(ii) පත්වීම් ලැබුවන් වහා වැඩ බාරගැනීමට සූදානම් වී සිටිය යුතුවත් හැර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**4. සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(අ) 1960 සැප්තැම්බර් 1 වෙනි දිනට වයස අවුරුදු 21ටත් 50ටත් අතර සිටින බවත් ;

(ආ) උසස් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවත් ;

(ඉ) තන්ඩලේ වරයකුගේ සහතිකයක් ලබා සිටින බවත් ;

(ඊ) ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ බස කියවීමට හා ලිවීමට හැකි බවත් ; සතුටුදායක අන්දමින් ඔප්පු කර සිටිය යුතුයි.

**සංලක්ෂ්‍යය.**—දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින සේවකයින් කෙරෙහි වයස සීමාව සලකන්නේ නැත.

5. අයදුම්කරුවන් සිය අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය. (මූලික සහතික එවිය යුතු නොවේ) :—

(අ) උප්පැන්න සහතිකයේ පිටපතක් (බව්තීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලා සඳහා අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කළ සහතික පත් බාරගනු නොලැබේ. එසේ වුවත් උප්පැන්නය ලියාපදිංචි වී නැති අය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන වයස සහතික බාරගනු ලැබේ.

(ආ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්.

(ඉ) මේ තනතුර ඉසිලීමට තරම් අධ්‍යාපන, චරිතය යනාදි සුදුසුකම් ඇති බැව් දක්වා මෑතදී ලබාගත් සහතික 3ක පිටපත්.

**සංලක්ෂ්‍යය.**—සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. අයදුම් පත් හා ඒ සම්බන්ධ වෙනත් ලියකියවිලි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, තැපැල් පෙට්ටිය 500, කොළඹ. යනුවෙන් ලිපිනය කොට එවිය යුතුය. කිසිවිටෙකත් මේ ලියකියවිලි දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට එවිය යුතු නොවේ.

7. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පළවී ඇති රජයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි කියවා බලන්න.

8. සෑම අයදුම් පතක් ම ලැබුණු බැව් දන්වනු ලැබේ. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට දින 6ක් ඇතුළත දී අයදුම් පත ලැබුන බැව් දන්වා නොඑවුවහොත් ඒ ගැන නොපමාව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් විමසිය යුතුය. මීට අනුව ක්‍රියා නොකරන්නවුන්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

ඒ. ඇම්. ඇම්. සහබ්දීන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැ. පෙ. 500,
කොළඹ.
1960 ජූලි මස 25 වැනි දින දීය.

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලාන්ච් කොක්ස්වේන් වරයකුගේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :—(අ) පෙළපත් නම :————.
(ආ) වෙනත් නම් :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. (අ) 1960 සැප්තැම්බර් 1 වෙනි දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය : අවුරුදු :——මාස :——දින :——.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. ජාතිය :————.

5. කාර්මික හා වෘත්තීය සුදුසුකම් : විභාග පැවැත්වූ හෝ පුහුණුවීම අවසන් කළ දින සහිතව :————.

6. පලපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. චරිතය පිළිබඳ සහතික ලබාගත් තැනැත්තාගේ නම් හා තරාතිරම් :————.

9. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹුද යන වග :————.

10. වෙනත් තොරතුරු :————.

මෙම අයදුම් පතෙහි දක්වන ලද තොරතුරු සියල්ල සත්‍ය බැව් මම සහතික කරමි. මෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත බැව් තෝරාගැනීමට පෙර එළිදරව් වුවහොත් මා ඊට නුසුදුස්සකු වන බවත් තෝරාගැනීමෙන් පසුව එළිදරව් වුවහොත් කිසියම් වන්දියක් නොගෙවා වහාම සේවය නවත්වනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවන් පුහුණුකරවීමේ පන්තිය

වර්ෂ 1949යේ අංක 10 දරන වෛද්‍ය සංශෝධිත පනත යටතේ නියමිත ලේඛනයේ "ඒ හෝ "එෆ්" යන කොටස් යටතේ ලියාපදිංචිවී සිටින ජ්‍යෙෂ්ඨ ප්‍රසූතිශාලා සහතික පත්‍ර ලත් සාත්තු සේවිකාවන්ගෙන් පැවැත්වෙන මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවන් පුහුණුකරවීමේ පන්තියට ඇතුළත් කරගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින්නාවූ මෙන්ම දෙපාර්තමේන්තුවේ පිටත සේවය කරන්නාවූ සාත්තු සේවිකාවන්ගේ අයදුම් පත් ද මේ සඳහා භාරගනු ලැබේ. දැනට දෙපාර්තමේන්තුවේ සේවය කරන සාත්තු සේවිකාවන්ගේ අයදුම්පත් නියමිත මාර්ගයෙන් එවිය යුතු ය. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන්නාවූ සාත්තු සේවිකාවන් කෙරෙහි අධ්‍යාපන සුදුසුකම් බලපාන්නේ නැත.

2. අයදුම් පත් මෙහි පහත පෙනෙන ආකෘති පෝර්මය අනුව සකස් කළ යුතු ය:—

(1) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

(2) ලිපිනය :————.

(3) උපන් දිනය සහ වර්ෂය :————.

(4) ජාතිය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

(5) විවාහක ද, අවිවාහක ද, විවාහක නම් පහත දැක්වෙන තොරතුරු දක්වන්න—

(අ) විවාහයට පෙර නම :————.

(ආ) ස්වාමිපුරුෂයා ජීවත්ව සිටී ද ? :————.

(ඉ) (i) ජීවත් වන්නේ පුරුෂයා සමඟ ද :————.

(ii) නීතිප්‍රකාර බෙන්වී ද :————.

(iii) වෙනත් මාර්ගයකින් ද :————.

(iv) ස්වාමිපුරුෂයාගේ රක්ෂාව කුමක් ද :————.

(v) රක්ෂාව කරන ස්ථානය :————.

(vi) ළමයින්ගේ ගණන :————.
වැඩිමහළුම ළමයාගේ වයස :————.
බාලම ළමයාගේ වයස :————.

(vii) ස්වාමිපුරුෂයාගේ අනුමතිය අයදුම්පතට අමුණා තිබේ ද :————.

(විවාහක අයදුම්කරුවන් විසින් ඔවුන් මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවන් වශයෙන් පුහුණු කර පසුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කර ගැනීම ගැන විරුද්ධත්වයක් නොමැති බැව් දැක්වෙන ලිපි සිය ස්වාමිපුරුෂයන්ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතු ය.)

(6) දැනට දෙපාර්තමේන්තුවේ සේවය කරයි නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :—

(අ) දැනට සේවය කරන ස්ථානය :————.

(ආ) සේවය කර ඇති අවුරුදු ගණන :————.

(ඉ) සාත්තු සේවිකාවන් පුහුණුකරවීමේ පන්තියට ඇතුළත් වූ දිනය :————.

(ඊ) සාත්තු සේවිකාවක් වශයෙන් පත් කළ දිනය :————.

(7) අධ්‍යාපනය ලැබූ ස්ථානය සහ සමත් වූ විභාග :————.

(i) ඉංග්‍රීසි
(ii) සිංහල
(iii) දෙමළ

(8) සාත්තු සේවා පුහුණුව ලැබුවේ කොහේ ද :————.

(9) වින්නඹු කර්මය පුහුණුවී සිටීද (සාත්තු සේවා සහ වින්නඹු සේවා සහතිකවල පිටපත් අමුණන්න) :————.

(10) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතිකපත් දෙකක පිටපත් අමුණන්න.

(11) පියාගේ හෝ භාරකාරයාගේ නම සහ ලිපිනය :————.

(12) භාෂා පිළිබඳ දැනුම :————.

ඉංග්‍රීසි : කියවීම, කථාව — ලිවීම
සිංහල : කියවීම, කථාව — ලිවීම
දෙමළ : කියවීම, කථාව — ලිවීම

(13) මීට කලින් ආණ්ඩුවේ රක්ෂාවක යෙදී සිටියෙහි නම් දින හා වකවානු සඳහන් කරන්න.

(14) සාත්තු සේවිකාවක් වශයෙන් ලියාපදිංචිවී සිටී ද ?————.
(සහතිකයේ පිටපතක් අමුණන්න)

(15) මෙහි පහත පෙනෙන සේවා කොන්දේසි පිළිගැනීමට කැමැති ද ? :————.

(16) මම අකාර්යක්ෂම භාවය නිසා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා හෝ නෙරපනු ලබා හෝ නැති අතර ක්‍රිමිනල් වරදක් යටතේ උසාවියකින් දඩුවම් ලබා හෝ නොමැති බැව් මෙයින් සහතික කරමි. මේ සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කළහොත් ඒ සඳහා ලැබෙන දඬුවම වහාම සේවයෙන් නෙරපා දැමීම බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

3. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1960.8.15 වැනි දාට යෙදේ. අයදුම්පත් බහාලන කවරවල ලිපිනය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, තැපැල් පෙට්ටිය 500, කොළඹ 1, යනුවෙන් ද "මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවන් සඳහා අයදුම් පත්" යනුවෙන් ද සඳහන් විය යුතු යි.

4. අයදුම් පත් මගේ හෝ දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට එවිය යුතු නොවේ.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1960 ජූලි මස 23 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

### මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවන්ගේ සේවා කොන්දේසි සහ වෙනත් දේ

අපේක්ෂිකාවන් සාමාන්‍ය සාත්තු සේවය සම්බන්ධයෙන් සුදුසුකම් ලබා තිබිය යුතු ය. වර්ෂ 1960.8.15 වැනි දිනට වයස අවුරුදු 35 කට වැඩි නොවිය යුතු ය. ඔවුහු ලාංකිකයින් විය යුත්තාහ.

2. පුහුණුවීම සඳහා අපේක්ෂිකාවන් තෝරාගනු ලබන්නේ ඒ සඳහා පත් කෙරෙන මණ්ඩලයක් මගිනි. තරඟ විභාගයක් පැවැත්වීමටද ඉඩ තිබේ.

3. සාමාර්ථය ලත් අපේක්ෂිකාවන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

4. තෝරාගැනීමෙන් පසු ඔවුහු වින්නඹු කර්මය සඳහා මාස 9ක කාලයක් ද සොයිසා කාන්තා ආරෝග්‍යශාලාවේ පුහුණුව ලබා නැත්නම්, එම පුහුණුව කොළඹ කාන්තා රෝහලේ දීත් මහජන සෞඛ්‍ය සාත්තු සේවිකාවක් වශයෙන් මාස 9ක් තුළ කළුතර සෞඛ්‍ය මධ්‍යස්ථානයෙහිදීත් පුහුණුව ලැබිය යුත්තාහ.

සෑම පාඨ මාර්ගයක් අවසානයේ දීම උගත් විෂයයන් පිළිබඳව පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

5. (අ) පුහුණුව ලබන කාලය සහ ඉන්පසු 3 අවුරුද්ද සෝදිසි කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

(ආ) නව ප්‍රවේශකයන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් පණවා ඇති හෝ මින් ඉදිරියට පණවනු ලබන හෝ නීතිරීති වලට අනුකූලවත් විශේෂයෙන් අංක 33 දරන 1956 රාජ්‍යභාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදීම සඳහා ක්‍රියා කළ යුතු වෙයි.

(ඉ) නව ප්‍රවේශකයකු (අංක 379 සහ 1957 මැයි 23 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ උප ඡේද 2 (ii) (බී) සහ 2 (ii) (සී) යටතේ ආදි ප්‍රවේශකයන් මෙන් නොගැනෙන 1956 සැප්තැම්බර් 24 වැනිදාට පසුව පත්කරනු ලැබූ රජයේ සේවකයන්) සිංහල භාෂා මාධ්‍යයෙන් පත්වීම් ලැබීමට සුදුසුකම් නොලැබුවහොත් සෝදිසි කාලය තුළ දී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබිය යුතු ය.

(ඊ) සෝදිසි කාලය අවසානයේ නව ප්‍රවේශක නිලධාරියකුගේ තනතුර ස්ථිර කරනු ලබන්නේ අන්‍ය කරුණු ද ඇතුළුව සිංහල භාෂාව ප්‍රවීණත්වය පිළිබඳ විභාගයකින් ද සමත් කිරීමෙන් පසුව ය.

(උ) සෝදිසි කාලය තුළ දී සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයකට එළඹිය නොහැකි වූවන්ගේ සේවය නවතාලීමට ඉඩ තිබේ. එහෙත් රාජ්‍ය භාෂාව ඉගෙණීමෙහි ලා නිර්ව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැයි පත්වීම් දුන් අධිකාරි තැනට හැඟී ගියහොත් සේවය නවතාලීම කල් දැමීමට ඉඩ තිබේ. ඉන්පසු සෑහෙන කාලසීමාවක් තුළ දී ඒ නිලධාරි තැන එම පරීක්ෂණයෙන් සමත් වුවහොත් ඒ පිළිබඳ වගකීම උසුලන නිලධාරියාගේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ යෑමද වෙනස් කරනු ලැබිය හැකිය.

6. සෝදිසි කාලය තුළ දී යම් සාත්තු සේවිකාවකගේ සේවය අසතුටුදායක යයි හැඟී ගියහොත් ඔවුන්ගේ සේවය නවත්වා දැමීමේ බලය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇත.

7. රාජකාරි කාලය තුළ දී ඇඳගෙන සිටිය යුතු නිල ඇඳුම් නොමිලයේ සපයනු ලැබේ.

3. මේ අපේක්ෂකයන්ට දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් ලියා දන්වනු ලැබේ.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ජූලි මස 25 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණය—1960 වේ අප්‍රේල් මස

වෂී 1960 ක්වූ ජූලි මස 8 වැනි දින හා අංක 12,156 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද වෂී 1960 ක්වූ ජූලි මස 4 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. එම නිවේදනයෙහි පළමුවැනි ඡේදයේ සඳහන් ඩී. එස්. පී. ඩේවිඩ් මෙතෙව්යගේ නම ඉදිරියෙන් ඇති "සිංහල" යන වචනය වෙනුවට "දෙමළ" යන වචනය යොදන ලද බැව් මෙයින් දනුම් දෙමි.

ස. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වෂී 1960 ක්වූ ජූලි මස 16 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් 28 වැනි දින පෙරවරු 9.30 දක්වා, ලංකා විශ්ව විද්‍යාලයට ලෝහ ජනේල (ටෙන්ඩර් අංක 285) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන් ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

1960 අප්‍රේල් 8 වැනි දින අංක 12,102 හා 1960 මැයි 27 වැනි දින අංක 12,136 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල සඳහන් ලෝහ ජනේල සැපයීම සඳහා වූ අංක අයි. සී. ඒ. 270 දරණ ටෙන්ඩරය අවලංගු කරන ලද බව කරුණාවෙන් සලකන්න.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 25 වෙනි දින,
කොළඹ 2.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### සී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් 5 වැනි දින පෙරවරු 9.30 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) ෂොප් ලුබ්‍රිකේටිං යුනිට් ආදී කරුණු 5ක් ... | සී. එල් එෆ්.—50 |
| (2) මෝටර් ඇනලයිසරයක් ආදී කරුණු 4ක් ... | සී. එල් එෆ්.—51 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැන ගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන් ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 25 වැනි දින,
කොළඹ 2.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ පාසන්ස් පාරේ ගුවන් හමුදා ප්‍රධාන කාර්‍යාලයේදී 1960 අගෝස්තු මස 15 වෙනි දින පෙරවරු 9.30 දක්වා රාජකීය ලංකා ගුවන් හමුදාවේ කටුනායක සහ දියතලාව අංශවලට පහත සඳහන් සේවය පිණිස ගුවන් හමුදාවේ අණදෙන නිලධාරි තුමා විසින්, සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(1) පාවහන් අළුත්වැඩියා කිරීම—නො. 1 ගබඩාව, කටුනායක සහ දියතලාව ;

(2) නිල ඇඳුම්, බැරැක්කයේ රෙදි සහ කූඩාරම් අළුත්වැඩියා කිරීම—දියතලාව පමණයි.

ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පෙර, ගුවන් හමුදාවේ සිවිල් අංශයේ ගනකාධිකාරීතුමා වෙත රු. 50 ක මුදලක් එක් එක් අංශයට වෙන් වෙන් වශයෙන් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කර ඉහත සඳහන් කාර්‍යාලයෙන් ලබාගත හැක.

දියතලාව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන්නෝ දියතලාව, බණ්ඩාර වෙල හෝ හපුතලේ හෝ වෙළඳ ආයතනයක් ඇතිවිය යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී කාර්‍යාලයේදී එම වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටිය හැක.

ජේ. ඇල්. බාකර්,
ගුවන් හමුදා අණදෙන නිලධාරී තැන.

---

## බදුල්ල බන්ධනාගාරයට පීරදූ කොහු හා කොහු මිටි සැපයීම

වෂී 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වෂී 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා බදුල්ල බන්ධනාගාරයට පීරදූ කොහු හා කොහු මිටි සැපයීම පිණිස (සීල් තබන ලද) ටෙන්ඩර් වෂී 1960 අගෝස්තු මස 12 වැනි දින දවල් 2.30 දක්වා බදුල්ල බන්ධනාගාරයේ උප අධිකාරිතුමන් විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කරන විට එය පිටපත් තුනකින් යුක්ත විය යුතුයි. ආකෘති පත්‍ර ලබා ගැනීමේදී රුපියල් 10 ක මුදලක් බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්‍යාලයේ හෝ කොළඹින් පිට නම් කච්චේරියක තැන්පත් කර රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී සඳහන් කරන මිල ගණන් ඉලක්කමින් සහ අකුරින් ද යෙදිය යුතුයි. එසේ සඳහන් කරන මිල ගණන් පරස්පර විරෝධී හෝ අකුරින් සඳහන් නොකළ ටැන්ඩර් ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තෝරා ගනු ලැබූ ටැන්ඩර්කරු විසින් රුපියල් 100 ක තැන්පත් මුදලක් නියමිත වැඩය අවංක ලෙස කිරීමට බැඳීසිටීමක් වශයෙන් කච්චේරියේ තැන්පත් කළ යුතුය. ඒ හා ගිවිසුම සම්පූර්ණ කිරීම සඳහා නියමිත මුද්දර ගාස්තුවද ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලැබූ ටැන්ඩර්කරුවා දින හතක් ඇතුළත නියමිත ගිවිසුමට ඇතුළත් නොවුවහොත් ටැන්ඩර් පත්‍ර ගැනීම සඳහා ඔහු විසින් කච්චේරියේ තැන්පත් කළ මුදල රාජ සන්තක කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර පහත අත්සන් කරන අයගෙන් දැනගත හැක.

ඊ. ඇම්. ද පොන්සේකා,
උප අධිකාරිතුමා.

බදුල්ල බන්ධනාගාරයේ උප අධිකාරිතුමන්ගේ
කාර්‍යාලයේ දී ය.
1960.7.13.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන ආයතනයේ තිබෙන පරණ හොවාර්ඩ් ට්‍රැක්ටරයක් විකිණීමට ටැන්ඩර් බාරගැනීම

පරණ හොවාර්ඩ් ට්‍රැක්ටරයක් විකිණීම පිණිස සීල් තබන ලද ටැන්ඩර හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන ආයතනය බාර නියෝජ්‍ය අධ්‍යක්ෂක තැන විසින් 1960 සැප්තැම්බර් මස 1 වැනි දින දක්වා බාර ගනු ලැබේ. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ලිපියකිනි. පෝර්ම දෙනු නොලැබේ.

2. ටෙන්ඩර් එවන හැම අයෙකුම ටෙන්ඩරයකට රු : 50.00 ඇප මුදලක් තැන්පත් කළ යුතු ය. තැන්පත් කැරෙන රු : 50.00 වෙනුවෙන් නිකුත් කරනු ලබන කුවිතාන්සිය ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන ආයතන භාර නියෝජ්‍ය අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ග්‍රාමසංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙහි හෝ මේ මුදල තැන්පත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩරයක්ම ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයෙහි වම් පැත්තේ උඩකෙළවරහි "පරණ හොවාර්ඩ් ට්‍රැක්ටරය මිල දී ගැනීමට ටෙන්ඩරය" යනු සඳහන් කළ යුතු ය.

4. ටෙන්ඩර් එවන්නේ ලියා පදිංචි කළ තැපැලෙන් නොවේ නම්, "පරණ හොවාර්ඩ් ට්‍රැක්ටරයක් මිලදී ගැනීමට ටෙන්ඩරය" යනු සඳහන් කළ ලියුම් කවරයක ටෙන්ඩරය බහා සීල් තබා ටෙන්ඩර ඉදිරිපත් කරන්න. අතින්ම හෝ ඔහුගේ නියෝජිතයෙකු අතින් හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන ආයතනයේ ඩබ්ලිව්. ඒ. රත්නවීර මහතාට බාර දිය යුතු ය.

5. 1960.9.1 දින පෙරවරු 10.30ට ටෙන්ඩර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර විවෘත කරන අවස්ථාවෙහි එතැනට පැමිණීමට ටෙන්ඩර එවන්නන්ට ඉඩ දෙනු ලැබේ.

6. මොනයම්ම ප්‍රශ්න නැඟීමකටවත් යටත් නොවී ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂෙප කිරීමට ආණ්ඩුවට බලය තිබේ.

7. තම ටෙන්ඩරය බාරගත් බවට දැන්වීමක් ලබා සතියක් ඇතුළත ටෙන්ඩර කරන ලද මුළු මුදල ගෙවා ට්‍රැක්ටරය ඉවත් කර ගැනීමට බාර ගනු ලැබූ ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද තැනැත්තා සූදානම්ව සිටිය යුතු ය.

8. ඉහත සඳහන් 7 වන ඡේදයේ ඇතුළත් කරුණු අනුව ක්‍රියා කිරීමට ටෙන්ඩර් එවන්නා අසමර්ථ වුවහොත් ඔහුගේ රු: 50.00 ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

9. හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන ආයතනයෙහිදී කාර්යාලය විවෘතව ඇති දිනයන්හි වැඩකරන කාල වේලාවන්හිදී ට්‍රැක්ටරය පරීක්ෂා කළ හැකිය.

ජේ. ඊ. ඩී. මඩවල,
නියෝජ්‍ය ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක තැන.

1960 ජූලි 23 දින,
හිඟුරක්ගොඩ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### තිස්ස උප කොට්ඨාශය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස වාරිමාර්ග උප කොට්ඨාශයේ කතරගම කරවිල වැව සමීපයේ ජ්‍යෙෂ්ඨ කාර්මික සහකාර තැනගේ නිවාසය තැනීම සඳහා ටෙන්ඩර්, මෙම දෙපාර්තමේන්තුවේ රු. 35,000 ට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන්, 1960 අගෝස්තු මස 16 වෙනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාරගනු ලැබේ.

තිස්ස උප කොට්ඨාශය භාර වාරිමාර්ග නිලධාරිතැනගෙන් අවශ්‍ය පෝරම ලබා පිටපත් දෙක බැගින් ටෙන්ඩර් ඉදිරිපත් කළයුතුය. මීට අදාල සැලසුම් ආදිය සිය කාර්යාලයේදී නැරඹිය හැක.

1960. 8. 8 දින සිට 1960. 8. 11 වෙනි දින දක්වා කාර්යාලයීය වේලාවන්හිදී මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, තිස්ස උප කොට්ඨාශය භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් රු. 50 ක මුදලක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

අයි. ද ලීමා,
උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැන,

තිස්සමහාරාම උප කොට්ඨාශය,
වාරිමාර්ග කාර්යාලය,
තිස්සමහාරාම.

---

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් හුරුළු වැව උප කොට්ඨාශය යටතේ කෙරෙන "මානන්කට්ටිය වැවේ රැල්පනාවට 6"—24" සක්ක ගල් සැපයීම සඳහා 1960 අගෝස්තු මස 24 වෙනි බදාදා සවස 2.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960.8.8 වෙනි දින සිට 1960 අගෝස්තු මස 23 වෙනි අඟහරුවාදා සවස 3.00 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි සහ ඒ අය ටෙන්ඩරය සඳහා රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩ වැව පිහිටි හුරුලු වැව උප කොට්ඨාශයේ. වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයට පමණි.

හුරුලු වැව උප කොටසේ, හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන ගෙන් ටෙන්ඩර් පෝර්ම සහ වැඩි විස්තර ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙක බැගින් යුක්තව ඉදිරිපත් කළ යුතුය.

ඒ. ආර්ජ්. මහගමගේ,
හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන,
හුරුලු වැව උප කොටස.

1960 ජූලි මස 22 වෙනි දින,
මෙගොඩවැව.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, හුරුලු වැව උප කොට්ඨාශය යටතේ කෙරෙන නිත්තගෝනැව වැව අලුත් වැඩියා කිරීම සඳහා 1960 අගෝස්තු මස 24 වෙනි බදාදා සවස 2.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960.8.8 වෙනි දින සිට 1960 අගෝස්තු මස 23 වෙනි අඟහරුවාදා සවස 3.00 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත් කරුවන්ට සහ ඒ අය ටෙන්ඩරය සඳහා රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩවැව පිහිටි හුරුලු වැව උප කොටසේ වාරි මාර්ග කාර්යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරි පත් කළ අයට පමණි.

හුරුලු වැව උප කොටසේ, හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන ගෙන් ටෙන්ඩර් පෝර්ම සහ වැඩි විස්තර ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙක බැගින් යුක්තව ඉදිරිපත් කළ යුතුය.

ඒ. ආර්ජ්. මහගමගේ,
හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන,
හුරුලු වැව උප කොටස.

1960 ජූලි මස 21 වෙනි දින,
මෙගොඩවැව.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ටොන් එකක් රුපියල් හය බැගින් කන්තලේ උක් ව්‍යාපාරයේ ටොන් 30,000ක් පමණ උක් දඬු අස්වැන්න කැපීම

ඉහත සඳහන් කාර්ය සඳහා ඉල්වීම් පත්‍ර 1960 අගෝස්තු මස 10 වැනි දින දක්වා උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරි තැන විසින් භාර ගන්නවා ඇත. වැඩ ඉල්විය යුත්තේ සමූපකාර කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරුවන් විසි පහකට වඩා සමූහයක් වැඩට යෙදවිය හැකි කොන්ත්‍රාත් කරුවන් පමණක් ය.

1. (අ) **උක් දඬු අස්වැන්න කැපීම.**—එක් එක් උක් දණ්ඩ පොළොවේ මට්ටමට කැපිය යුතුයි.

(ආ) උක් දණ්ඩේ අග් ගිස්ස උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරි හෝ ඔහුගේ නියෝජිතයෙකු පෙන්වා දෙන ලෙස කපා දැමිය යුතුයි.

(ඉ) කපා ගත් උක් දණ්ඩෙන් කොළ, කොළ කොපු ආදී දේ සුද්ධ කළ යුතුය.

(ඊ) උක් දඬු මිටි බැඳ සාමාන්‍යාධිකාරි හෝ ඔහුගේ නියෝජිත යෙකු හෝ පෙන්වා දෙන ට්‍රැක්ටර් ට්‍රේලර් වලට පැටවිය යුතුයි.

2. උක් කැපීම පිණිස උක් කපන පිහියා සාමාන්‍යාධිකාරි තුමා විසින් සපයනවා ඇත. මේ පිහියා කොන්ත්‍රාත්කරුවන් විසින් ආරක්ෂා ලෙස තබාගෙන කාර්ය අවසානයේදී සාමාන්‍යාධිකාරී තැනට භාරදිය යුතුය. නැතිවූ හෝ කැඩුණු පිහියාවලට වටිනාකම රජයේ නීති අනුව කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගන්නවා ඇත.

3. (අ) ඉහත සඳහන් කාර්ය සඳහා මුදල් ගෙවනු ලබන්නේ ටොන් එකකට රුපියල් හය බැගිනි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගේ කම්කරුවන් ගෙන ඒම සඳහා වාහන සපයා දීමට දෙපාර්තමේන්තුව සූදානම්ය. මේ වාහන පහසුව උක් ව්‍යාපාරයේ සිට මහා මාර්ගයේ සැත පුම් 20ක් දක්වා දෙනු ලැබේ. මේ වාහන සඳහා කොන්ත්‍රාත්කරුගෙන් උක් දඬු ටොන් එකකට රුපියල බැගින් අඩු කර ගෙවනවා ඇත. වාහන පහසුව ලබා ගන්නා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලබන්නේ උක් දඬු ටොන් එකකට රුපියල් පහක් පමණයි.

4. වැඩිදුර විස්තර උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරීගෙන් ලබා ගත හැක.

කේ. ඇස්. කුලතුංග.
කන්තලේ උක් ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරි වෙනුවට.

1960 ජූලි මස 22 වැනි දින.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

බස් රියැදුරන්ට සහ කොන්දොස්තරවරුන්ට කාකි බුෂ් කෝට් මහලා සපයාදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වේ අගෝස්තු 24 වෙනිදා වන බදාදා පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බිබිලේ, මොණරාගල සහ බුත්තල තිබෙන එළවළු ඇහිරීමේ ගබඩාවල සිට වැල්ලවාය සහ බඩල්කුඹුර සමුපකාර බහුකාර්ය සමිතිවලට අයත් මධ්‍යස්ථානවල සිට එළවළු සහ පළතුරු 1960.10.1 සිට 1961.9.30 දක්වා ඇති කාලය තුළද අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ පිහිටි වරිපොලි වෙළඳ සැලට ගෙනඒම සඳහා ටෙන්ඩර් 1960 අගෝස්තු මස 24 වැනි බදාදා අපරභාග 2.30 දක්වා කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1960 අගෝස්තු මස 24 වැනි බදාදා දවල් 12 වනතුරු ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගෙන ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

1960 ජූලි මස 22 වැනිදා,
කොළඹ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවකයින් හට සුළු ආහාරයක් සමග කිරි තේ සැපයීම.

වැඩි විස්තර කොළඹ වරාය කොමිෂන් සභාවේ පාලක ලේකම් තැනගෙන් ලබාගත හැක.

1960 අගෝස්තු මස 15 වෙනි සඳු දින දවල් 12 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 60.7.23.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නාරාහේන්පිට පිත් කරන පැක්ටරියේ අතිරේක ගබඩාව (2වෙනි කොටස) තැනීම සඳහා 1960 ජූලි මස 15වෙනි දින අංක 12,158 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ-නුවර පාරේ 25 වෙනි සැතපුම් කණුව අසල හබරාදුවේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තැනගේ නිවාසය තැනීම සඳහා 1960 ජූලි මස 22 වෙනි දින අංක 12,162 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටෙන්ඩර් දැන්වීමෙහි සඳහන් වැඩය කොළඹ නුවර පාරේ 25 වෙනි සැතපුම් කණුව අසල නිට්ටඹුව නම් බදලූවේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තු ඕවර්සියර් තැනගේ නිවාසය යනුවෙන් වෙනස් කරන ලද බව මෙයින් දන්වනු ඇත.

ටී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නාරාහේන්පිට පිත් කරන පැක්ටෙරියේ අතිරේක ගබඩාව (2 වෙනි කොටස) තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

රාගම තලගොල්ලේ ආරෝග්‍යශාලාවේ විකලංග අය සඳහා වාට්ටු දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාතීමේන්තුවේ උතුරු කොළඹ බාර විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,72,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

විලකටුපොත ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තැනගේ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාගෝ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැන ගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 22,500ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වි. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වලස්මුල්ලේ තානායමට වැසිකිළි දෙකක්, ජලය සැපයීම සහ කාණු තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. තංගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැන ගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6,500ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මීගහජන්දුර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තැනගේ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හම්බන්තොට ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 27,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වි. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

යාපනය මහරෝහලේ කසල කාණු ක්‍රමය සහ ඇක්ස්රේ කාමරය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960.7.25.

# විවිධ දැන්වීම්

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

**බඩු සැපයිය හැකි අය ලියා පදිංචි කිරීම**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට පහත සඳහන් බඩු සැපයිය හැකි වෙළඳුන් ලියා පදිංචි කිරීම පිණිස ඉල්ලුම් පත්, 1960 අගෝස්තු මස 26 වැනි සිකුරාදා සවස 3.00 වන තුරු කොළඹ, කොටුවේ, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ, අලෙවි කිරීමේ කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට උවමනා බඩු නම් :—**

(අ) කුළුබඩු (තුනපහ) වර්ග—දෙසතියක කාලය තුළ වුවමනා වේ.

(ආ) සුරුට්ටු, දුම්කොළ, හුණු—මාසයක කාලය තුළ වුවමනා වේ.

(ඉ) පොල්තෙල්—වුවමනාවූ විටකදී පමණක් සැපයිය යුතුයි.

(ඊ) කරවල වර්ග—දෙසතියක කාලය සිට හය මාසයක කාලය තුළ වේ.

(උ) කිකිලි බිත්තර—මාසයක කාලය තුළ වේ.

2. බඩු සැපයීම පිණිස, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලැයිස්තුවේ ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරුවන්, **තමන්ට සැපයිය හැකි බඩු වර්ගය පැහැදිලිව සඳහන් කර එවිය යුතුයි.**

3. දැනට ද්‍රව්‍ය සැපයීමට ලියාපදිංචි වී සිටින බඩු සපයන්නන් ද නැවතත්, ලියාපදිංචි කිරීම පිණිස ඉල්ලුම් කළ යුතුයි.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් තැන
වෙනුවට.

කොළඹ, කොටුව,
චැතැම් වීදියේ, අංක 62 දරණ ස්ථානයේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.
1960ක්වූ ජූලි මස 22 වැනි දින දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී